# දාබිඳු

පුවත්පතක් වශයෙන් ලියාපදිංචි කර ඇත

ආරම්භය 1984

40 වන කාණ්ඩය | 02 වන කලාපය | 2023 නොවැම්බර් කලාපය


# කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය තුරන් කිරීමේ ජාත්‍යන්තර දින සැමරුම 2023






ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට එරෙහි ගෝලීය දින 16 ක්‍රියාකාරීත්වය මෙවර තේමා කර ගනු ලැබුවේ "කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය තුරන් කිරීමයි". එය නොවැම්බර් 25 (කාන්තාවන්ට එරෙහි හිංසනය පිටුදැකීමේ ජාත්‍යන්තර දිනය) සිට දෙසැම්බර් 10 වනදා මානව හිමිකම් දිනය දක්වා ක්‍රියාත්මක වේ.

මෙම ව්‍යාපාරයට සහය දක්වමින්, 2030 වන විට එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයාගේ UNiTE මුලපිරීම් වන්නේ කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහි සියලු ආකාරයේ හිංසනයන් අවසන් කිරීමට උපකාර කිරීම සඳහා දැනුවත්භාවය වැඩි කිරීමට, උපදේශන ප්‍රයත්නයන් ශක්තිමත් කිරීමට සහ දැනුම සහ නවෝත්පාදන බෙදා ගැනීමට ගෝලීය ක්‍රියාමාර්ග ඉල්ලා සිටී.

2 වන පිටුවට...

## ඇතුළු පිටු


**03 පිටුව** - එක්සත් වන්න! කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහිව

**04 පිටුව** - කලාපයේ කාන්තාවන්ගේ ඔසප් දරිද්‍රතාවය

**05 පිටුව** - යුක්තියක් නොදුටු 33 වසරක්

**06 - 08 පිටුව** - අපේ වැඩ

**09 පිටුව** - විදෙස් විත්ති

**10 පිටුව** - සිතුවිල්ල / ප්‍රහේලිකාව

**11 පිටුව** - කවි පිටුව


නිදහස් වෙළඳ කලාපයේ ඉපැරණිම පුවත්පත

## ඩාබිඳු සාමුහිකය

221, වෙළබඩ පාර, කටුනායක
දුර : 011 4 851 383
ඊ. මේල් : dabindu.infoco@gmail.com
Facebook : dabindu collective sri lanka
Web : www.dabinducollective


# ජන වරමක් නැති ආණ්ඩුවේ ප්‍රභූ නඩත්තු 2024 අයවැය

අනාගත සුබ සිහින බිඳ දැමූ මෙවර අයවැය හිටපු ජනාධිපතිවරු නඩත්තු කිරීමටත් රටේ ණය පියවා ගැනීමටත් ජනාධිපතිවරයාගේ හා අගමැතිවරයාගේ අනාගත ලෝකය අත්පත් කර ගැනීමටත්, බඳු බර ජනතාව වෙතත් පැටවෙන පරිදි සකසන ලද අයවැයකි. වගකීම් පැහැර හරිමින් ද රටේ දරුවන්ගේ අධ්‍යාපනයට සෞඛ්‍යයට ඇති අයිතිය පැහැර හරිමින් ඒ සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදනවලින් රුපියල් බිලියන 75ක් කප්පාදු කොට පසුගිය වසරේ රුපියල් බිලියන 84ක් වූ හිටපු ජනාධිපතිවරු නඩත්තු කිරීමට වෙන් කළ මුදල රුපියල් බිලියන 110 දක්වා වැඩි කොට ඇත.

රටේ පවතින උද්ධමන තත්ත්වයන් තුළ ජනතාවට භාණ්ඩ හා සේවා ලබා ගැනීමේ දී බඳු වශයෙන් විශාල පිරිවැයක් දැරීමට සිදුව ඇත. එනම්, රුපියල් 10,000 ක් වියදම් කොට ලබා ගන්නා භාණ්ඩවල සැබෑ වටිනාකම රුපියල් 4914 කි. දරිද්‍රතා රේඛාව රුපියල් 16000 වන විට ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවට අනුව 4 දෙනෙකුගෙන් යුක්ත පවුලකට යැපීම සඳහා රුපියල් 64000ක් අවශ්‍යව ඇත. වැට් බද්ද 15% සිට 18% වැඩි කිරීම ද, 2014 වසරේ සිට මේ දක්වා විදුලි බිල 444% කින් වැඩි වීම ද, රටේ ලක්ෂ 5කගේ විදුලි බලය කපා දැමීම ද 2021 වසරේ සිට වැටුප 51%කින් අඩු වීම නිසා ද ආර්ථික අර්බුදයේ ගොදුරු බවට මහජනතාව පත්ව ඇත.

මේ මොහොතේ රටේ පවතින ගැටළුවලට විසඳුම් සොයනවා වෙනුවට මහා පරිමාණ වගාකරුවන්ට අක්කර 30000ක් වගා කිරීමට වෙන් කොට දී කුඩා පරිමාණයේ ගොවි පවුල්වලට කිසිදු වෙන් කිරීමක් සිදු කොට නැත. 2011 වසරේ සිට අධ්‍යාපනය සඳහා 6%ක් වෙන් කරන ලෙස ඉල්ලා සිටිය ද මෙවර අයවැයෙන් අධ්‍යාපනය සඳහා වෙන් කොට ඇත්තේ 0.002% කොටසකි. ඇඟළුම් ක්ෂේත්‍රයේ කර්මාන්ත වසා දමමින් කම්කරුවන් ලක්ෂ ගණනකට රැකියා අහිමි කරමින් වැටුප් වර්ධක, සුබසාධන පහසුකම් කප්පාදු කරමින් කම්කරුවන්ට විනාශකාරී වන නීතී රීතී හඳුන්වා දෙමින් වලපල්ලට ඇඳ දමා ඇත. සමාජ, දේශපාලන, ආර්ථික සංවර්ධනයන් වෙත යොමු වූ අයවැය සහනයක් වත් නොතබා ප්‍රභූන්ගේ අනාගත ලෝකය අත්පත් කර ගැනීම පිණිස සකසා ගත් 2024 අයවැය ජනතා බලාපොරොත්තු සුන් කළ අයවැයකි.

1 පිටුවෙන්... **කාන්තාවන්ට හා ගැහැණු**

2023 දී, UNiTE ප්‍රචාරක තේමාව වන්නේ කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය වැළැක්වීමට ඉදිරිගාමී කිරීමයි. සෑම රටකම සහ සංස්කෘතියකම, කාන්තාවන් ඔවුන්ගේ විවිධත්වය තුළ ප්‍රචණ්ඩත්වයෙන් සහ බලහත්කාරයෙන් තොරව ජීවත් වීම සහතික කිරීමට ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ. ප්‍රචණ්ඩත්වයේ සෞඛ්‍ය බලපෑම් කායික, මානසික, ලිංගික සහ ප්‍රජනක සෞඛ්‍යයට බලපාන ජීවිත කාලය පුරාම පැවතිය හැක. මහජන සෞඛ්‍ය, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ මානව හිමිකම් ගැටලුවක් ලෙස කාන්තාවන්ට එරෙහි හිංසනය කෙරෙහි අවධානය යොමු කිරීම සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම සඳහා ඩාබිඳු සාමුහිකය විසින් කාන්තා ලිංගිකත්වය පදනම් කරගත් හිංසනයට එරෙහිව අවධානය යොමු කරන ලද දින 16 ක ක්‍රියාකාරකම්වල ආරම්භය 2023 නොවැම්බර් 26 වන දින සනිටුහන් කරන ලදී. කටුනායක, බියගම, කිලිනොච්චි, සහ වවුනියාව යන ප්‍රදේශවල ඇඟළුම් කර්මාන්තයේ සේවක සේවිකාවන් එක්රැස් වූ මෙම සුවිශේෂී අවස්ථාව බියගම PT ගාර්ඩන් හෝටල් පරිශ්‍රයේදී පැවැත්විණි. මාධ්‍ය හා සිවිල් සංවිධාන ද මේ සඳහා සහභාගී විය. උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තිය ලෙස ව්‍රායි බල්තසාර් මහත්මිය ආරාධිත දේශනය පවත්වන ලදී. මෙම රැස්වීමේ රැකියා ස්ථානයේ ප්‍රචණ්ඩත්වය, විනෝදාස්වාද නැටුම් ප්‍රසංග, සහ තවත් බොහෝ දේ පිළිබඳ පුද්ගලික අත්දැකීම් බෙදා ගනිමින් බලපෑම් සහගත කම්කරු අදහස් ද ඉදිරිපත් කරන ලදී. සිවිල් සංවිධාන සාමාජිකයින්ගේ පොදු සාකච්ඡාවකින් උත්සවය සුහදව අවසන් විය.





# එක්සත් වන්න! කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය වැළැක්වීම සඳහා ආයෝජනය කරන්න

කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය අවසන් කිරීම සම්බන්ධයෙන් ලෝකය කොතරම් සැලකිලිමත්ද? අපි ඒ පිළිබඳව දන්නේ නැත. අප දන්නා දෙය නම්, කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහි හිංසනයෙහි මානව පිරිවැය ගණනය කළ නොහැකි බවයි. සෑම කාන්තාවන් තිදෙනෙකුගෙන් එක් අයෙකු තම ජීවිත කාලය තුළ අවම වශයෙන් එක් වරක් හෝ ශාරීරික හෝ ලිංගික හිංසනයට මුහුණදෙයි. කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය මානව හිමිකම් උල්ලංඝනය කිරීම් අතරින් වඩාත් ප්‍රචලිත සහ ව්‍යාප්ත වූවකි.

කොවිඩ්-19 වසංගතය, ගැටුම්කාරී තත්ත්වයන් සහ දේශගුණික විපර්යාස හරහා මෙම ප්‍රචණ්ඩත්වය සඳහා ඇති අවදානම් තවදුරටත් තීව්‍රකර ඇති අතර නව තර්ජන ජනිත කරමින්, කාන්තාවන් සහ ගැහැණු ළමයින් සම්බන්ධයෙන් පවතින අවදානම වැඩි කරනු ලබයි. කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය පවුල් සහ ප්‍රජාවන් තුළ පවතින සාමය සහ ස්ථාවරත්වයට බාධා ඇති කරයි. එය සෞඛ්‍ය සේවා, අධ්‍යාපනය, සමාජ ආරක්ෂණය, යුක්තිය සහ ඵලදායිතාව වැනි සමාජ තත්ත්වයන්වලට අප්‍රමාණ පිරිවැයක් ඇති කරනු ලබන්නේ එකී ආර්ථිකයන්ට ඒවායෙහි සම්පූර්ණ විභව හැකියාවන් සාක්ෂාත්කර ගැනීම වළක්වමිනි. විසඳුම පවතින්නේ එවන්වූ හිංසනකාරී තත්ත්වයන් උද්ගතවීම වැළැක්වීම සඳහා ආයෝජනය කිරීමද ඇතුළුව ශක්තිමත් ප්‍රතිචාරයන් දැක්වීම තුළය.

කෙසේ වෙතත්, අවාසනාවන්ත ලෙස, කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහි හිංසනයට එරෙහිවීමට ජාතීන් කෙතරම් කැපවී සිටිනවාද යන්න පිළිබඳ තත්ත්වය පිළිබිඹු කරනු ලබන දත්ත සොයාගැනීම ඉතා විරල කාරණයකි. කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය අවසන් කිරීම සඳහා කාන්තා අයිතිවාසිකම් සම්බන්ධයෙන් කටයුතු කරන සංවිධානවලට සහායවීම සහ ආයෝජනය කිරීම ප්‍රධාන සාධකයක් වේ.

දේශීය හා ගෝලීය ප්‍රතිපත්ති සම්පාදනයේදී කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවසන් කිරීමේ ප්‍රතිපත්තිමය වෙනසක් ඇති කිරීම සඳහා ප්‍රබල සහ ස්වාධීන ස්ත්‍රීවාදී ව්‍යාපාරයක් පැවතීම තනි තීරණාත්මක සාධකය බව පර්යේෂණ ඔස්සේ පෙන්වාදෙයි. කාන්තා සංවිධාන ප්‍රාදේශීය මට්ටමින් සේවා සැපයීම, කාන්තා සවිබල ගැන්වීම ශක්තිමත් කිරීම සහ තවදුරටත් සමාජ ප්‍රවාහයෙන් බැහැරවීමේ ඉඩක් ඇති අවදානමට ලක්වූවන් වෙත ළඟාවීම සඳහා ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. සිදුකරන ලද නවතම පර්යේෂණවලට අනුව, කාන්තා හිංසනයට එරෙහිව නීති සම්පාදනය කිරීමට ලෝකයේ රටවල්වලින් සියයට 78ක් ස්වකීය අයවැයවලින් කැපවීම පෙන්නුම්කර ඇත. එහෙත් මෙම රටවල් විසින් අධ්‍යාපනය, සෞඛ්‍යය, ආර්ථික සංවර්ධනය සහ සමාජ ආරක්ෂණය ඇතුළු විවිධ අංශ හරහා කාන්තාවන්ට එරෙහි හිංසනය වැළැක්වීම යන්න ඒකාබද්ධ කරනු ලබන්නේ කෙසේද යන්න අපැහැදිලිය.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට එරෙහි ක්‍රියාකාරීත්වයේ මෙම වසරේ දින 16 තුළ, ඔබ කොතරම් සැලකිලිමත්ද යන්න අපට පෙන්වාදෙන ලෙස අපි ඔබෙන් ඉල්ලා සිටින්නේ එබැවිනි. 2023 නොවැම්බර් 25 වැනි දින සිට දෙසැම්බර් 10 වැනි දින දක්වා ක්‍රියාත්මක වන ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට එරෙහි ක්‍රියාකාරීත්වයේ මෙම වසරේ දින 16ක ගෝලීය තේමාව වන්නේ **''එක්සත් වන්න! කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය වැළැක්වීම සඳහා ආයෝජනය කරන්න''** යන්නයි.

**අපි සියලුම පුරවැසියන්ගෙන් ඉල්ලා සිටින්නේ: ඔබ ක්‍රියා කරන ආකාරය අපට කියන්න.**

- **ප්‍රචණ්ඩත්වය නොඉවසීමේ පණිවිඩයක් ප්‍රවර්ධනය කිරීමට ඔබේ නිර්මාණශීලිත්වය භාවිත කරනවාද?**
- **කාන්තාවන්ට සහ පිරිමින්ට සමාන අයිතිවාසිකම් ඇති ලෝකයක් සඳහා වැඩ කරන බිම් මට්ටමේ සංවිධාන සමඟ සම්බන්ධවීමට ඔබේ කාලය යොදවනවාද?**
- **එසේත් නැතිනම් ඔබ සබැඳි සහ නොබැඳි සංවාදවලදී කාන්තාවන්ට එරෙහි හිංසන සංස්කෘතියකට දායකවන ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ඒකාකෘති ප්‍රශ්න කරනවාද?**

අපි ලොව පුරා රජයන්ගෙන්ද ඉල්ලා සිටින්නේ: කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය මුලිනුපුටා දැමීම වෙනුවෙන් එසේ සිදුවීම වැළැක්වීම සඳහා ආයෝජනය කරන්න.

කාන්තාවන්ට එරෙහි හිංසනය වැළැක්වීම සඳහා ආයෝජනය කරන සෑම උත්සාහයක්ම ආරක්ෂිත, වඩා සමානත්වයෙන් යුත් හා සමෘද්ධිමත් ලෝකයක් කරා යන පියවරකි.

උපුටා ගැනීම - එක්සත් ජාතීන්ගේ සංවිධානයේ කාන්තා අංශය




# කලාපයේ කාන්තාවන්ගේ ඔසප් දරිද්‍රතාවය වෙනුවෙන් වූ වැඩසටහන් මාලාව

ඔසප් දරිද්‍රතාවය යන්නෙන් අදහස් කරන්නේ අඩු ආදායම්ලාභී කාන්තාවන් සහ ගැහැණු ළමයින් ඔසප් සනීපාරක්ෂක නිෂ්පාදන වෙත ප්‍රවේශ වීමේදී මුහුණ දෙන දුෂ්කරතා ය. ආනයනික නිෂ්පාදන සඳහා බදු වැඩිකිරීම් මධ්‍යයේ රට දැඩි මුදල් අර්බුදයකට මුහුණ දීමත් සමඟ 2022 මාර්තු සිට සැප්තැම්බර් දක්වා සනීපාරක්ෂක තුවාවල මිල ඉහළ ගියේය. සැප්තැම්බර් වන විට, තුවා 15 පැකට්ටුවක මිල වෙළඳපොලේ රුපියල් 350 සිට 800 දක්වා පරාසයක පවතී. ශ්‍රී ලංකාවේ දළ වශයෙන් මිලියන 4.2 කාන්තාවන් ප්‍රමාණයක් ඔසප් වන අතර ඔවුන්ගෙන් 30% කට පමණක් ඉවත දැමිය හැකි ඔසප් සනීපාරක්ෂක නිෂ්පාදන සඳහා ප්‍රවේශය ඇත. ආනයනය කරන ලද ඔසප් සනීපාරක්ෂක නිෂ්පාදන සඳහා 52% ක බද්දක් පැනවීම නිසා එය 43% දක්වා සංශෝධනය කිරීමෙන් පසුව පවා අඩු ආදායම්ලාභී පවුල්වල අයට එවැනි නිෂ්පාදන ප්‍රවේශ විය නොහැකි විය. බොහෝ විට 'ටැම්පොන් බද්දක්' ලෙස හඳුන්වන මෙවැනි බදු, ගෝලීය වශයෙන් දරිද්‍රතාවයට තීරණාත්මක දායකත්වයක් සපයයි.

වෙළඳ කලාප ආශ්‍රිතව සේවයේ නියුතු කාන්තාවන් බහුල වශයෙන් මෙම ඔසප් දරිද්‍රතාවයෙන් පීඩා විඳිනු ලබයි. ආයතන තුළ දී සනීපාරක්ෂක තුවා මිලට ගැනීමේ හෝ බැහැර කිරීමේ පහසුකම් නොමැතිවීමත් එම දිනවල දී මුහුණ දෙනු ලබන ශාරීරික අපහසුකම් වෙනුවෙන් ද කිසිඳු පහසුකමක් මෙම කාන්තාවන්ට නොලැබේ. වෙළඳ කලාපීය කාන්තාවන් මුහුණ දෙනු ලබන මෙම අපහසුකම් සැළකිල්ලට ගනිමින් ඩාබිඳු සාමූහිකය ප්‍රමුඛ **"නිදහස් වෙළඳ කලාපීය සහයෝගීතාවය"** එක්ව ඔසප් දරිද්‍රතාවය වෙනුවෙන් **"Bleed with Dignity"** යන තේමාව යටතේ වැඩ සටහන් මාලාවක් පවත්වන ලදී. මෙහි පළමු අදියර වශයෙන් ඔසප් දරිද්‍රතාවය පිළිබඳව දැනුවත් කිරීමේ මාධ්‍ය හමුවක් 2023 ඔක්තෝබර් මස 21 වන දින කටුනායක ෆුල් මූන් හෝටලයේ දී පැවැත්විණි. මීට සමගාමීව පැවැත් වුණු වෛද්‍ය සාකච්ඡාව හා දැනුවත් කිරීමේ වැඩසටහන 2023 ඔක්තෝබර් මස 22 වන දින කටුනායක ඇවරිවත්තේ දී පැවැත්විණි. මේ සඳහා නිදහස් වෙළඳ කලාපීය සහයෝගීතාවය නියෝජනය කරමින් ශ්‍රමාභිමාණී කේන්ද්‍රය, ස්ටෑන්ඩ්අප් මූමන්ට්, මානව විමුක්තිය උදෙසා සංවර්ධනය ව්‍යාපාරය, We Woman Lanka, NUSS යන සංවිධාන ඩාබිඳු සාමූහිකය සමඟ එක්ව මෙම වැඩසටහන සංවිධානය කරන ලදී. මෙහි දී සීදූව සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලයේ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී M.A.G.S. සේනාරත්න මහතා දේශනයක් සිදු කළ අතර පොලිස් හා හෙද දැනුවත් කිරීම් ද සිදු කෙරුණු අතර සනීපරක්ෂක තුවා නොමිලයේ බෙදා හැරීමක් හා ප්‍රදර්ශනාත්මක දැනුවත් කිරීම් රැසකින් මෙම වැඩසටහන සමන්විත විය. මෙම වැඩසටහනෙහිම දිගුවක් වශයෙන් ඩාබිඳු සාමූහිකය බියගම කම්කරු කාන්තාවන් වෙනුවෙන් ද සනීපාරක්ෂක තුවා නොමිලයේ බෙදා හරින ලදී.











# යුක්තියක් නොදුටු 33 වසරක කඳුළු කතාවක්

පුද්ගලයෙකු අතුරුදහන් වූ විට ඔහු හෝ ඇය මිය ගොස් සිටිනවා ද නැතිනම් ජීවතුන් අතර සිටිනවා ද යන්න නිශ්චිතවම පැවසිය නොහැක. අතුරුදහන් වූවෙකුගේ පවුල් සාමාජිකයන්ට ඇත්තේ ඔවුන් තවමත් ජීවතුන් අතර ඇතැයි යන බලාපොරොත්තුව පමණි. ලංකා ඉතිහාසය තුළ මෙම අතුරුදහන් වූවන්ගේ ඉතිහාසය 1971 දදක්වා අතීතයකට දිව යයි. 1971 කැරැල්ලේ දී මිය ගිය තරුණ තරුණියන් මෙන්ම අතුරුදහන් වූ පුද්ගලයින් සම්බන්ධයෙන් එවකට පැවති රජය පිළිගත හැකි සාධාරණ හේතු ඉදිරිපත් නොවුණි. එමෙන්ම 1983 සිට පැවති උතුරු - නැගෙනහිර යුද්ධය සහ 1987 හා 1989 කාලය පුරාවට පැවති දකුණේ අරගලකාරී තත්ත්වය නිසා අතුරුදහන් වී ඇති ලක්ෂයකට ආසන්න පිරිසක් පිළිබඳව එදා මෙදා පැවති කිසිදු රජයක් පිළිගත හැකි හේතු ඉදිරිපත් කිරීමට අපොහොසත් වී ඇත. ඒ අතර නිදහස් වෙළඳ කලාප සේවකයින් 11 දෙනෙකු අතුරුදහන් වූ අතර ලයනල් රංජිත් සහෝදරයන් ද කම්කරු නීති උල්ලංඝණය වීම් වෙනුවෙන් පෙනී සිටි නිසා 1987 ඔක්තෝබර් 27 දින රද්දොළුගම හන්දියේ දී වෙඩි තබා මරා දමන ලදි.

මෑත අතීතයේ 2006/2009 කාලය තුළ පැවති උතුරු නැගෙනහිර යුද්ධය මිනිස් ජීවිත දහස් ගණනක් ජීවිතක්ෂයට පත් කරමින් අවසන් විය. මේ හේතුවෙන් උතුරේත් දකුනේත් වැසියන් සියදහස් ගණනක් අදටත් අතුරුදහන් වී ඇත. මොවුන්ට සිදු වූයේ කුමක් ද ඔවුන් අදටත් අත්අඩංගුවේ පසුවේ ද රඳවාගෙන සිටින්නේ ද නැතිනම් මිය ගොසින් ද යන්න නොවිසඳුනු ගැටළුවකි. 2015 වසරේ දී රජය විසින් අතුරුදහන් වූවන්ගේ කාර්යාලය පිහිටු වන ලදී. නමුත් 2019 දී බලයට පත් වූ රජය සිය අධිකාරීමය බලය යොදා ගනිමින් අකර්මණ්‍ය කර දැමූ අතර අතුරුදහන් වූ පවුල්වල සාමාජිකයින්ට තමන්ගේ අතුරුදහන් වූ පුද්ගලයා සම්බන්ධයෙන් වූ අවසාන බලාපොරොත්තුව ද අත්හැර දැමීමට සිදු විය.

එහෙත් අතුරුදහන් වූවන්ගේ පවුල් එකමුතුව තමන්ගේ දරුවන් සහ සමීපතමයින් වෙනුවෙන් යුක්තිය ලබා ගැනීමේ අරගලය අත්හැරියේ නැත. 2023 ඔක්තෝබර් 27 වන දින 33 වන වරටත් අතුරුදහන් වූවන්ගේ වාර්ෂික සමරුව පවත්වන ලදී. මෙම ස්මරණ උත්සවය “Bring them Home” තේමාව යටතේ සීදූව, රද්දොළුගම අතුරුදහන් වූවන්ගේ ස්මාරකය අසල දී පවත් වන ලදී. මෙවර මෙම සිහිපත් කිරීමේ වැඩසටහනට අතුරුදහන් වූවන්ගේ පවුල්වල සාමාජිකයින් හා සිවිල් සංවිධානවල සාමාජිකයින් විශාල පිරිසක් සම්බන්ධ විය. එමෙන්ම ආගමික නායකයින්, ශ්‍රී ලංකාවේ විදේශ තානාපති කාර්යාල සහ රාජ්‍ය නොවන සංවිධාන නියෝජනය කරමින් පිරිස රැස්ව සිටියහ. අතුරුදහන් වූවන්ගේ පවුල් එකමුතුවේ විධායක අධ්‍යක්ෂක බ්‍රිටෝ ප්‍රනාන්දු ප්‍රකාශ කර සිටියේ ''කොන්දේසි විරහිතව ඕනෑම අතුරුදහන්වීමකට එරෙහි වෙමු'' යන සටන් පාඨය යටතේ අප පුද්ගලයින්ගේ මානවීය අයිතිවාසිකම් සුරැකීම වෙනුවෙන් කොන්දේසි විරහිතව එකාවන්ව පෙළ ගැසිය යුතු බවයි.

# වියළි ආහාර බෙදා දීම








උතුරු පළාතේ කර්මාන්ත ශාලා වැසී යාම හේතුවෙන් ආර්ථික අර්බුදයෙන් පීඩාවට පත්ව සිටින කම්කරු කාන්තාවන් වෙනුවෙන් සිදු කෙරෙන වැඩ සටහන් වල තවත් දිගුවක් ලෙස වියළි ආහාර බෙදා දීමේ වැඩ පිළිවෙලක් ඩාබිඳු සාමූහිකය විසින් සංවිධානය කරන ලදී. දීපාවලී දිනය මුලික කර ගනිමින් මෙම වැඩසටහන් වවුනියා හා කිලිනොච්චි දිස්ත්‍රික්කවල කම්කරු කාන්තාවන් මුලික කර ගනිමින් ක්‍රියාත්මක කෙරිණි. නොවැම්බර් 12 වන දින වවුනියා දිස්ත්‍රික්කයේ කාන්තාවන් 50 දෙනෙකු හා, නොවැම්බර් 13 වන දින කිලිනොච්චි දිස්ත්‍රික්කයේ කාන්තාවන් 50 දෙනෙකු වෙනුවෙන් ද මෙම වියළි ආහාර බෙදා දීම සිදු කරනු ලැබීය.

# පොදු කුස්සිය



රටේ පවතින්නා වූ වත්මන් ආර්ථික අර්බුදය හමුවේ පෝෂ්‍යදායක ආහාර වේලක් සපයා ගැනීම බොහෝමයක් දෙනෙකුට ගැටළුවක් බවට පත්ව ඇත. ඇඟළුම් සේවිකාවන්ට ආයතන මඟින් ලබා දෙන්නා වූ ආහාර ද කිසිසේත්ම පෝෂ්‍යදායක අන්දමින් සකස් නොවේ. මෙසේ අඩු පෝෂණ තත්ත්ව යටතේ රැකියාවන්හි නිරත වන්නා වූ කාන්තාවන්ට සවියක් වීම පිණිස ඩාබිඳු සාමූහිකයේ අපි පොදු කුස්සිය වැඩ සටහන ආරම්භ කරන ලදී. මේ හරහා කම්කරු කාන්තාවන්ට ඔවුන්ගේම ශ්‍රම දායකත්වය ඇතිව වඩා සෞඛ්‍යාරක්ෂිතව හා පෝෂ්‍යදායක ලෙස සැකසූ ආහාර වේලක් භුක්ති විඳීමේ අවකාශය සැළසේ. මෙවර ඩාබිඳු පොදු කුස්සිය සුබසාදන වැඩසටහන් මාලාව ඔක්තෝබර් මස 08 වන දින කිලිනොච්චි හා වව්නියා යන දිස්ත්‍රික්කවල දී සාර්ථකව ක්‍රියාත්මක කෙරිණි.










# මානසික සුවතාවය වෙනුවෙන් වූ දෙදින උපදේශන වැඩසටහන් මාලාව

මානසික සුවතාවය ඕනෑම කෙනෙකුගේ ජීවිතයේ යහපැවැත්මට පාදක වන්නා වූ මූලිකම සාධකයකි. විශේෂයෙන්ම විවිධ දුෂ්කරතා යටතේ ඇඟළුම් කර්මාන්තාලාවල සේවය කරන කාන්තාවන්ගේ මානසික සුවතාවය පිළිබඳව සංවේදීව මැදිහත්වීම සමාජ සේවා සංවිධානයක් ලෙස ඩාබිඳු අපගේ මූලික ඇගයුම්වලින් එකකි. ඔවුන්ගේ ගැටළුවලට සංවේදී වන අප කාර්යය මණ්ඩලයේ මානසික සුවතාවය හා ආතති කළමණාකරණය අරමුණු කර ගනිමින් උපදේශන වැඩසටහන් මාලාවක් පවත්වන ලදී. තනි හා කණ්ඩායම් වශයෙන් මෙම උපදේශන වැඩසටහන් පවත්වන ලද අතර සහකම්පනය වැඩි දියුණු කිරීම, සංගීතමය උපදේශන අංග, ආතති කළමණාකරණය හා සංවාදමය සාකච්ඡා හරහා මෙම වැඩසටහන් ක්‍රියාත්මක විය. 2023 ඔක්තෝම්බර් මස 30 සහ 31 යන දිනවල දී කටුනායක වයිට් පැලස් හෝටල් පරිශ්‍රයේ දී මෙම දෙදින නේවාසික උපදේශන සැසිය පවත්වන ලදී. මෙම සැසියේදී, කාර්ය මණ්ඩල සාමාජිකයින්ට ආතතිය කළමනාකරණය කරන්නේ කෙසේද යන්න හඳුනාගෙන ඉගෙන ගැනීමට සහ පාලන කවය පිළිබඳව ඉගෙන ගැනීමට ද හැකි වූ අතර කණ්ඩායම් ක්‍රියාකාරකම් හරහා කාර්ය මණ්ඩලයේ ජීවිත අත්දැකීම් බෙදාහදා ගැනීමටද හැකි විය. මානසික සෞඛ්‍යය සහ මනෝ සමාජීය ආධාරක ජාලය (MHPSS.net) මේ සඳහා සම්පත් දායකත්වය දක්වන ලදී.

# ආසියාවට පොදු වැටුප් සංධානයේ ක්ෂේත්‍ර චාරිකාව



ආසියාවට පොදු වැටුප් සංධානය සහ එහි පාර්ශවකරුවන් ක්ෂේත්‍ර චාරිකාවක් සඳහා නොවැම්බර් 03 වන දින ඩාබිඳු පරිශ්‍රයට පැමිණුනි. ඉන්දියානු, බංගලාදේශ, පාකිස්ථානු හා කාම්බෝජියානු කම්කරු නායකයින් මෙම ක්ෂේත්‍ර චාරිකාව සඳහා සම්බන්ධ විය. මෙහි දී ඩාබිඳු සාමූහිකයේ ඉතිහාසය හා එහි ක්‍රියාකාරීත්වය පිළිබඳව පැමිණි පිරිස සමඟ අදහස් හුවමාරු කර ගත් අතරම, කම්කරු කාන්තාවන් සිය අයිතීන් උදෙසා සංවිධානය වීමේ වැදගත්කම පිළිබඳව සාකච්ඡා කරන ලද අතර විදේශීය සමාජිකයින් විසින් සිය අත්දැකීම්ද හුවමාරු කර ගත් අතර වෘත්තීය සමිතියක් ලෙස සංවිධානය වීමේ වැදගත්කමත් කාන්තාවන් සිය අයිතීන් උදෙසා සක්‍රීය ලෙස සංවිධානය වීමත් නීතීමය වශයෙන් හඬ නැගීමේ වැදගත්කමත් මෙහි දී මූලික වශයෙන් සාකච්ඡා කෙරිණි.







# යෝජිත කම්කරු නීති ප්‍රතිසංස්කරණ මඟින් කාන්තාවන් මත ඇති කළ හැකි අයහපත් බලපෑම් පිළිබඳ විරෝධය පළ කරන ලද මාධ්‍ය හමුව

ආසියාවට පොදු වැටුප් සංධානයේ කාන්තා නායකත්ව කමිටුව විසින් නොවැම්බර් 01 දින මාධ්‍ය සාකච්ඡාවක් පවත්වමින් යෝජිත කම්කරු නීති ප්‍රතිසංස්කරණ මගින් කාන්තාවන් මත ඇති කළ හැකි අයහපත් බලපෑම් පිළිබඳ විරෝධය පළ කරන ලදී. කම්කරු අමාත්‍ය මනූෂ නානායක්කාර මහතා විසින් ඉදිරිපත් කළ යෝජිත කම්කරු නීති ප්‍රතිසංස්කරණ මගින් කාන්තාවන් මත ඇති කළ හැකි අයහපත් බලපෑම් හා කාන්තා නායිකාවන් දිගින් දිගටම කම්කරු නිති හා ප්‍රතිසංස්කරණ සකස් කිරීම් වලින් ඉවත් කිරීම සම්බන්ධයෙන් මෙම මාධ්‍ය හමුවේදී (2023. 11. 01) දින අදහස් ඉදිරිපත් කරන ලදි. මෙම මාධ්‍ය හමුව සඳහා නීතිඥ ලක්මාලී හේමචන්ද්‍ර විසින් මෙහෙයවනු ලැබූ අතර, ඩාබිඳු සාමූහිකය වෙනුවෙන් චමිලා තුෂාරි, ස්ටෑන්ඩ් අප් වෘත්තීය සමිතියේ, අශීලා දන්දෙණිය නිමි භාණ්ඩ, ඇඟළුම් හා රෙදිපිළි සේවක සංගමයේ, ලලිතා දේදුවකුමාර, වාණිජ හා කාර්මික සේවක සංගමයේ, නීතිඥ ස්වස්ථිකා ආරුලිංගම් මහත්මීන් විසින් තම අදහස් දක්වන ලදි.

# කිලිනොච්චි වවුනියා පාර්ශවකරුවන්ගේ හමුවීම




ඩාබිඳු සාමූහිකය 2023 නොවැම්බර් 30 වැනි දින සිවිල් සංවිධානවල සාමාජිකයන්, පොලිසිය, රජයේ නිලධාරීන් සමඟ පාර්ශවකරුවන්ගේ හමුවක් වවුනියාවේදී පවත්වන ලදී. මෙහිදී ඇඟළුම් ක්ෂේත්‍රයේ සේවක සේවිකාවන් කම්හලේ දී සහ සමාජය තුළ මුහුණ දෙන වත්මන් ගැටලු පිළිබඳව සාකච්ඡා කරන ලද අතර, නිළධාරීන්ගේ අත්දැකීම් සහ අදහස් හුවමාරු කර ගැනීම සහ ඉදිරි කටයුතු පිළිබඳව ද මෙහිදී සාකච්ඡා කරන ලදී. මෙම සාකච්ඡා ඇසුරෙන් ඉදිරි ක්‍රියාමාර්ග සැලසුම් කිරීමටත් අපගේ කටයුතු උතුරු පළාත තුළ පුළුල්ව දියත් කිරීමටත් අවශ්‍ය පදනම සකස් කර ගැනීමට මෙම පාර්ශවකරුවන්ගේ හමුවීම මඟ පෙන්වීමක් විය.



# විදෙස් විත්ති

බංග්ලාදේශයේ කම්කරු අමාත්‍යාංශය නොවැම්බර් 7 වන අඟහරුවාදා රටේ මිලියන 4.4 ඇඟළුම් කම්කරුවන් සඳහා එරට මුදල් ඒකකයෙන් බංග්ලාදේශ ටකා 12,500 ක නව අවම වැටුපක් යෝජනා කළේය. එම මුදල වෘත්තීය සමිති ඉල්ලීම වන බංග්ලාදේශ ටකා 23,000 ට වඩා බෙහෙවින් අඩු ය. පර්යේෂණ අධ්‍යයනයන් සනාථ කරන පරිදි කම්කරුවන් දරිද්‍රතා රේඛාවට ඉහලින් තැබීමට අවශ්‍ය අවම මුදල බංග්ලාදේශ ටකා 23,000 බවයි. නව අවම වැටුප ඉදිරි වසර 5ක මූලික පැවැත්ම සඳහා ප්‍රමාණවත් නොවන බව දක්වමින් කම්කරුවන් මෙම තීරණය හෙළා දකී. කම්කරුවන් දැනටමත් අමතර වැඩ මුරවලයෙදෙන අතර (ඔවුන්ගේ සාමාන්‍ය පැය 48 වැඩ සතිය ඉක්මවා), ණය සහ මුදල් ඉතිරි කර ගැනීම සඳහා ආහාර වේල් මග හැරීමෙන් උපයන ආදායම මත සිය මූලික අවශ්‍යතා පාලනය කරයි.

මෙම විනිවිදභාවයෙන් තොර සහ පක්ෂග්‍රාහී වැටුප් සැකසීමේ ක්‍රියාවලිය හේතුවෙන් බංග්ලාදේශයේ සති ගණනාවක නොසන්සුන්තාවයක් පැවතුණි. පසුගිය මාසයේ අවම වැටුප බංග්ලාදේශ ටකා 10,400 දක්වා ඉහළ නැංවීමට එරට රජය යෝජනා කිරීමෙන් පසු රට පුරා කම්කරුවන් විරෝධතා ආරම්භ කළහ. විරෝධතා අතරතුර කම්කරුවන් 6 දෙනෙකු මිය ගොස් ඇති අතර, කඳුළු ගෑස්, රබර් උණ්ඩ සහ ජීව උණ්ඩ ආකාරයෙන් පොලිස් ප්‍රචණ්ඩත්වයට මුහුණ දීමෙන් කම්කරුවන් විශාල පිරිසක් තුවාල ලබා ඇත. අත්අඩංගුවට ගැනීම් සම්බන්ධයෙන් බරපතල කනස්සල්ලක් මතු කරමින් විරෝධතාවයේ නිරත කම්කරුවන්ට එරෙහිව නඩු පවරමින් තිබේ.

බංගලාදේශයේ කර්මාන්තශාලා හිමිකරුවන් කියා සිටින්නේ තමන්ට අවම වැටුප බංග්ලාදේශ ටකා 12,500 ට වඩා වැඩි කිරීමට ඔවුන්ට හැකියාවක් නොමැති බවයි, සමහරක් කියා සිටින්නේ මෙම වැටුප සමහර උප කොන්ත්‍රාත්කරුවන් ව්‍යාපාරයෙන් ඉවත් වීමට හේතු විය හැකි බවයි. කෙසේ වෙතත්, කර්මාන්තයේ මිල නියම කරන්නේ ගැනුම්කරුවන් - ජාත්‍යන්තර විලාසිතා සන්නාමයන් ය. ප්‍රතිපත්තිමය වශයෙන්, ඔවුන්ගේ මිලදී ගැනීමේ මිල සෑම විටම කම්කරුවන්ට ජීවන වැටුපක් ගෙවීමට කර්මාන්තශාලා හිමියන්ට ඉඩ දිය යුතුය. තවමත්, බොහෝ අවස්ථාවලදී, බංගලාදේශය වැනි දකුණු ආසියාතික රටවල දරිද්‍රතා මට්ටමේ අවම වැටුප්




ගෙවීමට සන්නාම මගින් ගෙවන මිල කිසිසේත් ප්‍රමාණවත් නොවේ.

බංගලාදේශ ටකා 23,000 ක අවම වැටුපක් සඳහා වන වෘත්තීය සමිති ඉල්ලීමට පැහැදිලිවම පිටුබලය දෙන ලෙස Clean Clothes Campaign සංවිධානය විසින් ජාත්‍යන්තර ගැනුම්කරුවන්ට බහුවිධ දැනුම් දීම් ලබා දී තිබියදීත්, ශ්‍රම පිරිවැය වැඩිවීමට අනුව ඔවුන්ගේම මිල ඉහළ නංවන බවට සැපයුම්කරුවන්ට සහතික වීමට, එක් වෙළඳ නාමයක් හැර අනෙක් සියල්ල එය ප්‍රතික්ෂේප කර ඇත. බංගලාදේශයේ වෘත්තීය සමිති වසර පහකට පෙර සිටම වැටුප් සැකසීමේ ක්‍රියාවලියේ අසමානතා පිළිබඳ තියුණු විවේචන මතු කර ඇත. වෘත්තීය සමිති ඉල්ලා සිටින්නේ වසර පහකට වරක් වෙනුවට වාර්ෂික අවම වැටුප සංශෝධනය කරන ලෙසයි. වැටුප් පාලක මණ්ඩලයේ සේවක නියෝජිතයා තෝරා ගත යුත්තේ වැඩිම නියෝජනයක් ඇති වෘත්තීය සමිතියෙන් බව ද වෘත්තීය සමිති පෙන්වා දෙයි. මෙම වැටුප් සාකච්ඡා සහ පෙර වැටුප් සාකච්ඡා වලදී, සේවා යෝජකයාට සහ රජයේ අවශ්‍යතාවලට හිතකර "කම්කරුවන්ගේ නියෝජිතයෙකු" ස්ථාපනය කිරීම සඳහා වන රෙගුලාසිය ද උල්ලංඝනය කර ඇත. අවසාන වශයෙන්, වෘත්තීය සමිති නායකයින් පෙන්වා දෙන්නේ, බංගලාදේශ ටකා 23,000 ක් පිළිබඳව වූ ඔවුන්ගේ යෝජනාව නොසලකා හැරීම මඟින් රටේ කම්කරු නීතිය (බංග්ලාදේශ කම්කරු පනත) සහ ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන් (අවම වැටුප් නියම කිරීම පිළිබඳ ILO සම්මුතිය 131) යන දෙකම යටතේ නියම කර ඇති නිර්ණායක උල්ලංඝණය කර ඇති බවයි.

# සිතුවිල්ල


**ලෝකය පෙරළෙයි කාලේ ගෙවී යයි. සිතූ දේ නොම වෙයි නොසිතූ දෙයක් වෙයි ලෝ දම් කැරකෙනවා...**

ආ නංගී මොකද කොල්ලා බූට් එකක් තිබ්බ ද නැත්නම් කලාපෙ වැහෙන්න යන නිසා ද කියා අසමින් සෝමා බෝඩිමට ගොඩ වුනේ අතේ රොටියක් ද අතැතිවය. උදේට කෑව ද මොන පිස්සු ද තේ උගුරක් බොන්න සීනි ඇටයක්වත් නෑ. ඒක ගන්නත් සතොසට යන්න එපැයි. එහෙ යන්න තියා අපිට චූ කරන්න වත් වෙලාවක් තියෙනවද, ඔය කතාව තියලා රොටිය කාලා ඉදින්, අද වැඩ තිබුන නම් කිරි කහට එකක් බීලා දවල්ටත් සප්පායම් වෙලා එන්න තිබුනා. ඔය දේශනය නවත්තලා කාලා හිටින් බඩේ පනුවෝ බොක්ෂින් ගහන්න ඉස්සෙල්ලා. නැත්නම් ගෑස් හැදෙයි. ඒකටත් බදු ගහයි ද දන්නෙ නෑ. බදු ගහන්නෙ නැත්තේ මොනවට ද ඉස්සර කාලේ නම් බලු බද්ද කියලත් තිබුනලු නේද? ඉස්සර නම් අතිකාල තිබුනා. අර එල්ලුම් ගහ වගේ වැටුපට අමතරව දෙන දීමනා අර්ථසාධකයට අහුවෙන නිසා ඇයි කපන කැපිලි අතට ලැබෙන්නේ කීය ද ඒ දවස්වල දෙන දීමනා නිසා යාන්තම් ජාමේ බේර ගත්තා. නැත්නම් අඥ්ඥ කොරොස් තමයි. අපිටත් කොයි වෙලේ කලාපෙන් චුත වෙලා යන්න වෙයි ද දන්නෙ නෑ ඇයි මෙහෙන් බෝඩිම් ගාස්තුවේ ඉදන් හැම දෙයක්ම වැඩි වෙලා. අතට ලැබෙන මුදල අඩු වෙලා බදු බර වැඩි වෙනකොට අපේ බර අඩු වේගෙන යනවා. කලාපයේ ශ්‍රමිකයෝ මන්දපෝෂණයෙන් පෙළෙයි. රක්තහීනතාවය, ඇස් පෙණීම අඩුබව, දණහිස් අමාරු, හතිය, පීනස හරියට ජාතික රෝහල වගෙයි. විවාහ දිවියක් ගෙවා ගන්න හැකි ද යන්න ගැන විශ්වාසයක් නෑ. ඉස්සර කාලේ නම් බඳින්න හෙව්වේ පිට අය, දැන් අපේ අර්ථසාධකය තියෙන නිසා අපි ගැනත් බලන අය ඉන්නවා.

පසුගිය කාලය තුළ ලක්ෂ ගණන් කලාප තුළ සේවය කළ පිරිස් අඩු වේගෙන ගිහින් වෙළඳ කලාප වැහෙයි ද නැත්නම් ජීවන වියදම ඉහළ ගිහින් ඔවුන්ගෙන් යැපෙන වෙළඳුන්ට, බෝඩිම් හිමියන්ට ලැබෙන ආදායම් අඩු වෙලා විදේශ රැකියා සඳහා බොහෝ ශ්‍රමිකයන් පිටවී යන නිසා ආයෝජකයින් ද කර්මාන්තශාලා වසා දමා ඇත. පෞද්ගලික අංශයේ සේවය කරන බැවින් රජයෙන් ලැබෙන පඩි වැඩි කිරීම් ඔවුන්ට ලැබෙන්නේ නැහැ. වෘත්තීය සමිති හා සංවිධාන තුළින් ලැබෙන සහය තමයි අපේ ගැලවුම් කාරයෝ කලින් ඇති වූ ETF ප්‍රශ්නයේ දී අරගලකරුවන්ට ජීවිත පූජා කිරීමට වගේම අතපය කඩා ගනිමින් සටන් කරන්නවුනා. හත්වලාමේ වෙච්ච දේට මක් කරන්නද බදු බරත් අපේ බඩටම ගහල තියෙන නිසා.

සමන්තා

# ප්‍රහේලිකා අංක - 44



## හරහට

1. ජේසු බිළිදා උපත ලද්දේ මෙහිදී ය
4. මාසේ පෝය දිනය
7. සුරා
8. උතුර හා බටහිර අතර පිහිටන අනු දිශාව
10. ශුෂ්ක කලාපවල වැවෙන පැළෑටි විශේෂයකි
12. සුප්‍රකට ශාකුන්තල්‍ය ලියූ සාහිත්‍යධරයා
15. ජලයෙහි උපන්
17. උඩරට නැටුමේ මේවා දහඅටක් ගැන කියවේ
19. රිය ධාවනයට පහසු වන සේ පාර සැකසීමට භාවිතා වේ
20. උමංදාවේ එන පඬිවරුන් සතර දෙනාගෙන් කෙනෙකි

## පහළට

1. මෙම ගඟෙන් මෙගොඩට බළල් පැටවෙක් වත් නොගෙන ආ යුතු බව කියවේ
2. සැන්දෑ යාමේ පිපෙන සුවඳවත් කුඩා මල් විශේෂයකි
3. දේව ගතියක් සේ සැළකේ
5. ස්ත්‍රීන් බොහෝ විට හෙළි කිරීමට අකමැති බව කියවේ
6. ගැඹුරු ලිංවලින් දිය ඇඳීමට උපකාරී වේ
9. යකඩින් කළ දණ්ඩ
11. භාරතයේ ලෝ සුපතළ චිත්‍ර රැදුණු ගුහා පෙළ
13. තඹ පතෙහි ලියූ ලියවිල්ල
14. කර්මාන්ත ශාලාවට සමාන පදයකි
16. සටනකදී කාගේත් පැතුම
18. සීනි සෑදීමට පැණි ලබා ගන්නා ගස් විශේෂයකි

**මෙම ප්‍රහේලිකාව නිවැරදිව පුරවා මෙම ලිපිනයට එවා තෑගි දිනන්න.**
**ඩාබිඳු සාමුහිකය**
**221, වෙළබඩ පාර, කටුනායක.**

# නිර්මාණ

උදේ හතට පටන් අරන් හවස හතට නිමවෙනවා
පැයෙන් පැයට ටාකට් එක ඉල්ලා අප මරවනවා
පැයක් දෙකක් අඩු වුනොත් සුපවයිසර් පුප්පනවා
සත්තයි මාසෙට වියදම් නැත්නම් රස්සාවෙන් අස්වෙනවා

මාස දවස් පැය තත්පර කාලය ඔහේ ගෙවෙන්නේ
පොඩි දරුවන් පවුල එක්ක කල් ගෙවන්න වෙලා නැත්තේ

ජීවන වියදමක් එක්ක රස්සාවයි කල් ගෙවෙන්නේ
කෙතරම් කැපවීම් කළත් හීන නෑනේ සැබෑවෙන්නේ
ඉස්සර වගේ නෙවෙයිනේ දැන් ආර්ථිකේ වැඩිවෙලා
රස්සාවට නොගියෝතින් අපි මාසෙම හිරවෙලා
මුළු මාසෙම ගියත් වැඩට පඩිය නෑනේ ඇතිවෙලා
මා හට මා පවු හිතෙනවා වියදම් ගැන සිහිවෙලා
වතුර, විදුලි බිලත් එක්ක බෝඩිං බිල් වැඩි වෙනවා
ඕටී අඩු කරන නිසා මාසේ පඩිය අඩු වෙනවා
පඩිය කෙතරම් අඩු කෙරුවත් ඉඩු බිල නම් වැඩි වෙනවා

ජීවන වියදමත් එක්ක කම්කරුවන් මිරිකෙනවා
හදිස්සියට අසනීපෙට නිවාඩු නෑ කියනවා
දවස් දෙකක් නොගියෝතින් ගෙදරම ඉන්න කියනවා
මුළු මාසෙම වැඩට ගියත් පඩිය  අපේ කැපෙනවා
මේ ප්‍රශ්න විසඳ ගන්න පිළියම් අපි හොයනවා

ප්‍රියංගිකා - බියගම



# ජීවිතයයි මහනනේ



අඟ හිඟ ණැගුණු විට පවුලේ වියදමට
ඒ බර පැටවුනේ මාගේ කර මතට
එකම ඇඳුම ඇඳගෙන නොහඬා දුකට
රිඳුණු සිත අරන් ආවේ නගරයට
හීනෙන් හීනෙට ගේ දොර ඉඳිවෙන්නේ
ඉසුරු සොයා මා එනතුරු උන් ඉන්නේ
මා මෙහි විඳින දුක මා පමණයි දන්නේ
මැෂිමට වඩා එවිටයි  සිත හැඩවෙන්නේ
දිවි බර වෙනුවෙනුයි මා මෙහි වෙහෙසෙන්නේ
ඉහළින් ලැබෙන අණටයි වාඩ නිමවෙන්නේ
සුළු වරදටත් නැත වෙනසක් බැට කන්නේ
ඉදිකටු නූල් මැෂිමටත් සිත මැසවෙන්නේ
මැහිලා කැපිලා සොච්චම් පඩියකි එන්නේ
ඒ මුත් වටින හින්දයි මෙහි ගත වෙන්නේ
ආරාධනා හොරහින් ඉඟි බිඟි එන්නේ
සැලෙනා හදට සමහර වුන් පැටපෙන්නේ
මත් බමරුන් මඟ කොට දී හමුවන්නේ
දුප්පත් කමටදෝ ඔච්චම් කරන්නේ
ප්‍රේමය උන් ගෙනෙන බැව් නැත දැනෙන්නේ
ඉරෙන ලිහෙන ජීවිතයයි මහනනේ

හර්ෂණී - බියගම




# සේවකයින්ගේ පඩිපතට, වාර්ෂික ප්‍රසාද දීමනාවට කණ කොකා හඬයි

වසරක් සේවය කොට උපයා ගත් නිවාඩුව පවා නොලබා පවුල් පරිසරයෙන් ඈත්ව කටුක අත්දැකීම් ලබමින් සිටින වෙළඳ කලාපයේ සේවකයින්ට ඔවුන්ගේ රැකියාවන් මෙන්ම ජීවිත ද අවධානමට ලක් කොට ඇත.

**බෝනස් එකත් කප්පාදු කරයි** - පවතින ආර්ථික අර්බුද දඩමීමා කර ගනිමින් වෙනත් වසරවල සේවකයින්ට ලබා දුන් වාර්ෂික ප්‍රසාද දීමනාව ලබා දිය නොහැකි බවට ඇඟළුම් ක්ෂේත්‍රයේ ප්‍රධාන නම් දරා සිටින ආයතන ප්‍රකාශ කොට ඇත. ජීවත් වීමට සරිලන වැටුප් නොලබද්දී, ටාගට් වැඩි කරමින් තිබහට වතුර ටිකක්වත් බීමට නොහැකි වන පරිදි බැනුම් අසමින් ටාගට් කවර් නොකරන අවස්ථාවල දී අසැබි වචනවලින් පවා බැණ වදිමින් මානසික පීඩනයට ලක් කරමින් රැකියාව පිළිබඳව කිසිදු තෘප්තිමත්භාවයක් නැතිව කරන කැප කිරීමට පාලක පක්ෂය කිසිඳු සංවේදීතාවයක් නොදක්වයි.

**දීර්ඝ නිවාඩු සඳහා කවරින්** - නත්තල වෙනුවෙන් ලබා දෙන දින 10ක නිවාඩුව වෙනුවෙන් සමහර ආයතන කවරින් කිරීමට පවසා ඇති අතර එම නිසා පසුගිය මස 2ක කාලය පටන් සෙනසුරාදා හවස් වරුව එම කවරින් කිරීමට කාලය වෙන් කිරීමට සිදුව ඇති බව ද මේ නිසා අතිකාල අහිමිව ඇති බව ද සේවක සේවිකාවන් පවසයි.

**වාර්ෂික වැටුප් වැඩි වීම** - කොවිඩ් ආර්ථික අර්බුද හේතුවෙන් වන බදු, ණයවලට ගොදුරු වෙමින් කම්කරුවන් වලපල්ලට ඇඳ දමා තුන්වේල කන්න අහිමි කොට ඇති අවස්ථාවක සාධාරණව වැටුප් වැඩි වීමක් ඉල්ලා සිටිය ද රුපියල් 3,500ක වැටුප් වැඩිවීමට එහා යාමට පාලකයින් කටයුතු නොකරන බවට සේවකයින් පවසයි. විදුලි බිල, අත්‍යවශ්‍ය භාණ්ඩවල සිට මිල ඉහළ යාමට සාපේක්ෂව වැටුප් වැඩි වීමක් අයවැයෙන් සහන සැලසීමක් බලාපොරොත්තු වුවද ඒවා සිහින බවට පත් කොට ඇත. පසුගිය කාලයේ සමහර ආයතන විසින් ලබා දුන් ජීවන වියදම් දීමනාව සමහර ආයතන මාස කිහිපයකින් කපා දැමූ අතර සමහර ආයතන එම මුදලෙන් භාගයක් 2024 වසරේ දී මූලික වැටුපට එකතු කිරීමට කටයුතු කොට ඇත.

එසේම ආයතන පාඩු ලබන බවට පවසා සේවකයින්ට වන්දි ලබා දී ආයතනයෙන් ඉවත් කළ ද අළුතින් සේවකයින් නැවත බඳවා ගැනීම් සිදු වන බව පවසන සේවකයින් වැඩ මුර ක්‍රමයට තිබූ සේවා මුර 3ක් 2ක් බවට පත් කිරීම නිසා සමහර සේවකයින් සේවා අංශ මාරු කිරීමට සිදු වී අපහසුතාවයන්ට පත්ව ඇත. මේ අතර මෑන් පවර් සේවකයින් යොදවා වැඩ කිරීමට ගන්නා උත්සාහයන් තුළ පළුඳු නිෂ්පාදන සැකසීමට ස්ථිර සේවකයින්ට සිදු වන බව ද ඉහළ නිෂ්පාදන ඉලක්ක ලබා දෙන නිසා කිසිදු විවේකයක් නොමැති බව ද පවසයි. පඩි රහිත නිවාඩු ලබා ගත් විට අතිකාල නොදී හරින බව ද බෝනස්වලින් කපා දමන බව ද පවසයි. පැමිණීමේ දීමනාව වශයෙන් රුපියල් 5,500ක් පමණ ලබා දෙන සමහර ආයතන දින එකහමාරක දී එම සම්පූර්ණ මුදල කපා දමන බව ද දන්වන ලදී. මේ දිනවල අතිකාල නොමැති නිසා වැටුප මාසික වියදම් සඳහා ප්‍රමාණවත් නොවන බව පවසයි. වෙනදා වාර්ෂික චාරිකා, සාද, විවිධ ත්‍යාග ලබා දුන්න ද ඒවා කපා දමා ඇති බව ද කනස්සල්ලෙන් යුතුව සේවකයින් පවසා සිටී.

අංකඃ 221, වෙළබඩ පාර, කටුනායක හි පදිංචි එච්. අයි. සමන්මලී වන මා විසින් මීගමුව රන්වැකි මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදි.